# ලංකාව මුස්ලිම් නොවීම

මෙරට මුස්ලිම් ජනයාගේ සම්භවය ගැන සොයන ඕනෑම කෙනෙකුට මගහැරිය නොහැකි සාධක කිහිපයක් වෙයි. එනම් මුවර් මුස්ලිම් යනුවෙන් හැඳින්වෙන පිරිස දෙමළ කතාකරිම හා ජා, මැලේ ආදී වශයෙන් හැඳින්වෙන පිරිසෙන් ඉතා විශාල බහුතරයක් අද වන විට සිංහල කතාකිරීම ය. ඔවුන් කිසිවකුවත් විශේෂයෙන් ම මුවර් යනුවෙන් හැඳින්වෙන මුස්ලිමුන් අරාබි කතා නොකිරීම ය. එමෙන් ම මෙරට මුස්ලිම් ආගමික ස්ථානවල ඉතිගසය  එතරම් ඈතට නොයැමත් කිසිවකුටවත් අමතක නොකළ හැකි ය

අප බොහෝ දෙනා අතර පතුරුවා ඇති මතයක් නම් ලංකාවට පැමිණි අරාබි වෙළෙන්දන් මෙරට සිංහල කාන්තාවන් සමග විවාහ වීමෙන් වත්මන් මුස්ලිම් ජනතාව ඇති වූ බව ය. බැලූ බැල්මට මෙහි සත්‍යතාවක් තිබේ යැයි කෙනකු සිතනවා විය හැකි ය. එහෙත් ප්‍රශ්නයක් වෙයි. අරාබි පියකුගේ හා සිංහල මවකගේ දරුවකු කතාකළ යුත්තේ කිනම් බසක් ද? ඒ එක්කෝ අරාබි නැතහොත් සිංහල විය යුතු ය  එහෙත් ප්‍රශ්නය ඔවුන්ගෙන් පැවතෙන්නන් යැයි කියන්නන් දෙමළ කතාකිරීම ය. ඒ සිද්ධවීය හැකි  ද?

අරාබි සිංහල එකතුවෙන් බිහිවී යැයි කියන මුස්ලිම් ජනයා දෙමළ කතාකරන්නේ ඇයි ද යනුවෙන් ඇසූ කල සාමාන්‍යයෙන් දෙන පිළිතුර නම් මෙරට වාසය කළ දෙමළ ජනයාගේ ආභාසය හේතුකොට ගෙන ඒ එසේ සිද්ධ වී ඇති බව ය. ඉතිහාසය නොදන්නා යමකුට අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශයේ පදිංචි මුස්ලිම් ජනයා ගැන එසේ කිවහැකි වුව ද අනෙක් බොහෝ පළාත්වල සිංහල මිනිසුන් සමග ජීවත්වන මුවර් යනුවෙන් හැඳින්වෙන මුස්ලිම් ජනයා දෙමළ කතාකරන්නේ කිනම් ආභසයකින් දැයි කිව හැකි ද? ඔවුන්ට ඊනියා ආභාසයක් දීමට දෙමළ ජනයා නැතිවීමෙන් පෙන්නුම් කරන්නේ ආභාස කතාව බොරුවක් බව ය.

මේ අසංගත ප්‍රවාදය වෙනුවට ලංකාවේ සෑම පළාතකම වෙසෙන මූවර් යැයි හැඳින්වෙන මුස්ලිම් ජනයා දෙමළ කතාකරන්නේ ඇයි ද යන ප්‍රශ්නයට සංගත පිළිතුරක් දිය හැකි ය. එනම් මේ මුස්ලිම් ජනයා භාරතයේ දෙමළ කතාකරන ප්‍රදේශයකින් ලංකාවට සංක්‍රමණය වූ මුස්ලිම් ජනයාගෙන් පැවත එන පිරිසක් බව ය. මෙහි දී කිවයුතු තවත් කරුණක් වෙයි. අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශයෙහි මුස්ලිම් ජනයා පදිංචි කරනු ලැබුයේ කන්ද උඩරට සිංහල රජවරුන් විසිනි. එසේ කරනු ලැබුයේ ද ඒ ප්‍රදේශයෙහි ඉංගිරිසින් විසින් දෙමළ ජනයා පදිංචි කරනු ලැබීමට පෙර ය. වත්මන් නැගෙනහිර පළාතෙහි දෙමළ ජනයා පදිංචිකරනු ලැබුයේ ඉංගිරිසින් විසින් බව අමතක නොකළ යුතු ය. එයට පෙර ඒ ප්‍රදේශයෙහි දෙමළ ජනයා නොසිටි බව එහි දෙමළ බෞද්ධයන් ගැන කතාකරන සිංහල බෞද්ධ විරෝධී මහාචාර්යවරුන් දැනගත යුතුව ඇත.

ඉන් කියැවෙන්නේ අද නැගෙනහිර නමින් හැඳින්වෙන ප්‍රදේශයෙහි වුව ද මුස්ලිම්වරුනට එහි දෙමළ ජනයාගෙන් ඊනියා ආභාසයක් ලබාගැනීමට ඉඩක් නොවූ බව ය. මේ මුවර් යනුවෙන් හැඳින්වෙන මුස්ලිම් ජනයා භාරතයෙන් ලංකාවට සංක්‍රමණය වන අවධියේ දී ම දෙමළ දැන සිට ඇත. ඔවුන් මෙහි පදිංචි වී ඇත්තේ බටහිර වෙරළ තීරුවෙහි බව පැහැදිළි ය, ඉන්පසු මෙහි පැමිණි කතෝලික පෘතුගීසීන් මුස්ලිම් ජනයාට හිරිහැර කරන විට සිංහල රජවරු මුස්ලිමුන් ලංකාවේ නැගෙනහිර වෙරළෙහි හා රට මැද පදිංචි කළහ.

ඈත අතීතයෙහි අරාබිකරයෙන් මෙරටට වෙළෙඳුන් නොපැමිණියේ යැයි මෙයින් නො කියැවෙයි. ඔවුන් එසේ පැමිණිය ද ස්ථිර මුස්ලිම් වාසස්ථාන ඇති වූ බවට සාක්ෂි නැත. හැරත් එසේ පැමිණි අරාබි වෙළෙඳුන් සිංහල කාන්තාවන් සරණපාවා ගත්ත ද ඔවුන්ගේ දරුවන් සිංහල හැරෙන්නට වෙනත් බසක් කතාකරන්නට නැත. එසේ පැවතෙන්නන් කල්යෑමේ දී සිංහල වුවා නිසැක ය. ඒ පැවතෙන්නන් ඉස්ලාම් ආගම ඇදහූ බවට ද සාක්ෂි නොමැත. ලංකාවේ මුස්ලිම් පල්ලිවල ඉතිහාසය කෙසේවත් අවුරුදු පන්සීයකට එහා යන්නක් නො වේ. ලංකාවේ ස්ථිර මුස්ලිම් වාසස්ථාන පෘතුගීසීන් පැමිණීමට ටික කලකට පෙර භාරතයෙන් පැමිණි දෙමළ කතාකළ මුස්ලිම් ජනයා විසින් බිහිකරනු ලබන්නට ඇති බව ඉතා පැහැදිළි ය.

© Prof. Nalin De Silva

ලංකාවේ මෙන් ම භාරතයේ ද පැරණි පොත්වල යෝන යෝනක නමින් හඳුන්වන ලද පිරිසක් ගැන සඳහන් වෙයි. මොවුහු මූලික වශයෙන් ම ග්‍රීකයෝ වූහ යැයි සිතිය හැකි ය. එසේ ම ඔවුන් අතර බටහිර ආසියාවෙන් පැමිණි අය ද ඉන්නට ඇත.  එමෙන් ම මුස්ලිමුන් ද සිටින්නට ඇත. එහෙත් ඒ තනිකර මුස්ලිම් වූවා නො වේ.

මේ මුවර් නමින් හැඳින්වෙන මුස්ලිමුන්ට අමතර ව, මැලේ නමින් හැඳින්වෙන මුස්ලිම් ජනයා ද වෙති. ඔවුහු ලන්දේසි හා බ්‍රිතාන්‍ය යටත්විජිත කාලවල මෙරටට ගෙන්වූවෝ හෝ පැමිණියෝ හෝ වෙති. බ්‍රිතාන්‍යයෝ පොලිස් සේවයෙහි යෙදවීම සඳහා ද මේ අය ගෙන්වූහ. මැලේ මුස්ලිම්වරු ඇතැම් විටෙක ජා නමින් ද හැඳින්වෙති. වත්මන් මලයාසියාව මේ බොහෝ දෙනකුගේ මුල් බිම වන අතර ඔවුහු මැලේ භාෂාව කතාකරති. ඔවුහු ආගමින් ඉස්ලාම් වෙති.

මැලේ මුස්ලිම්වරු සිංහල ජනතාව සමග වාසය කළ අතර ආවාහ විවාහ මගින් සිංහලයන් සමග මිශ්‍ර වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස අද මේ පිරිසෙන් බොහෝ දෙනකු සිංහල වී අවසාන ය. ඔවුහු සංස්කෘතියෙන් සිංහල බෞද්ධ වෙති. ඇතැම් විට ආගමින් ඉස්ලාම් වෙති. සිංහල බෞද්ධ, සිංහල ක්‍රිස්තියානි මෙන් මොවුන් සිංහල ඉස්ලාම් යනුවෙන් හැඳින්වීමේ වරදක් නැත.

පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට සිංහල ඉස්ලාම් හෙවත් මැලේ ජනයා නො සිටියහ. එවකට මෙරට සිටියේ මුවර් නමින් හැඳින්වෙන දකුණු භාරතයෙන් පැමිණි දෙමළ කතාකරන මුස්ලිම් ජනයා ය. පෘතුගීසීන් නොපැමිණියේ නම් මේ මුස්ලිම් ජනයාට ලංකාවේ බලයට පත්වීමට කිසිදු ඉඩක් තිබුණේ ද? අප කලින් සඳහන් කර ඇති පරිදි මේ පරීක්ෂණයකින් හෝ නිරීක්ෂණයකින් හෝ දැනගත හැක්කක් නො වේ.  අද නැවත වරක් පෘතුගීසීන් පැමිණීමට පෙර තිබූ තත්වයට ආපසු ගොස් කුමක් සිදුවන්නට තිබුණේ දැයි නිරීක්ෂණය කළ හැකි නො වේ.

ඊනියා පරීක්ෂණාත්මක ක්‍රමය එහි දී  අසාර්ථක වෙයි. එහෙත් ඒ ක්‍රමය යොදාගත නොහැකි වුවත් ඉන් අදහස් කරන්නේ අපට ඒ පිළිබඳව කිසිවක් කීමට නොහැකි බව නො වේ. පෘතුගීසීන් මෙරටට පැමිණෙන සමයෙහි මුස්ලිම්වරුන්ගේ ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සම්බන්ධතා හා ඒ ක්ෂෙත්‍රවල ඔවුන්ගේ ශක්තීන් අධ්‍යයනය කිරීමෙන් අපට යම් යම් නිගමනවලට එළඹීමට හැකි ය.

අපට පෙනී යන ආකාරයට ඒ කිසිම ක්ෂෙත්‍රයක මුස්ලිම්වරුනට බලයක් තිබී නැත. ඔවුන් පෘතුගීසීන්ට විරුද්ධව සිංහල රජවරුන්ට ආධාර කර ඇත. පෘතුගීසීන් තමන්ට තර්ජනයක් බව මුස්ලිම් ජනයාට මුලදීම තේරුම් ගොස් ඇත. එක් පැත්තකින් පෘතුගීසීන් මෙරට ආර්ථික සම්බන්ධතා වෙනස්කිරීම හේතුවෙන් වෙළෙඳාමෙහි දී මුස්ලිම් ජනයාට තිබූ විශේෂ වාසිසහගත තත්ත්වයන් නැතිවූවාට සැකයක් නැත. අනෙක් පැත්තෙන් සියවස් ගණනාවක් පුරා යුරෝපයේ හා බටහිර ආසියාවේ සංස්කෘතික හා දේශපාලනික කතෝලික මුස්ලිම් භේදය හේතුකොටගෙන මුස්ලිම් ජනයා පෘතුගීසීන්ගේ වෛරයට පාත්‍ර වන්නට ඇත. කලක් ස්පාඤ්ඤය පවා මුස්ලිම් ආධිපත්‍යයට ගොදුරු වී තිබූ බව අමතක නොකළ යුතු ය.

එහෙත් ලංකාවේ කිසිම අවස්ථාවක දී පෘතුගීසීන්ට විරුද්ධව තනිවම කිසිවක් කිරීමේ හැකියාවක් මුස්ලිම් ජනයාට තිබී නැත. ඔවුන්ට දේශපාලන ශක්තියක් තිබූ බවට සාක්ෂි නැත. මුස්ලිම්වරුන් කර ඇත්තේ පෘතුගීසීන්ට විරුද්ධව සිංහල රජවරුන්ට ආධාර කිරීම පමණකි. අනතුරුව පෘතුගීසීන්ගේ හිරිහැර වැඩිවන විට සිංහල රජවරුන්ගේ පිහිටෙන් නැගෙනහිර වෙරළ තීරුවේ හා කඳුකරයේ ඇතැම් ප්‍රදේශවල පදිංචිවීම ය. කලින් සඳහන් කර ඇති පරිදි සිංහල රජවරු ඒ ප්‍රදේශවල මුස්ලිම් ජනයා පදිංචි කරවූහ.

පෘතුගීසීන් පැමිණෙන විට ආර්ථික දේශපාලනික හා සංස්කෘතික ක්ෂෙත්‍රවල බලයක් නොතිබූ ඒ නිසාම තමන්ට හිරිහැර සිදුවන විට සිංහල රජවරුන්ගේ පිහිට පැතූ මුස්ලිම් ජනයාට අඩුම තරමින් දේශපාලන නායකත්වයක් පමණවත් නොමැතිව මෙරට බලය අල්ලා ගැනීමේ අවස්ථාවක් තිබිණි යැයි කීම සිහිනෙන් දෙඩවීමක් පමණකි. එසේ බලය අල්ලා ගැනීමේ කිසිම හැකියාවක් නැතිව මෙරට ඉස්ලාම් ආගම ව්‍යාප්ත කිරීමට ඔවුන්ට කිසිම ඉඩක් නොතිබිණි. මෙහි දී වැදගත්වන තවත් කරුණක් නම් මුස්ලිම් ජනයා එලෙස බලය අල්ලාගැනීමට හා ඉස්ලාම් ආගම ව්‍යාප්ත කිරීමට

© Prof. Nalin De Silva

තිබුණි යැයි කියන්නේ බටහිරයන් හා ඔවුන් අනුව යන ඉතිහාසඥයන් හා මතවාද ප්‍රචාරය කරන්නන් වීම ය. සාමාන්‍යයෙන් මුස්ලිම් ජනයා එවැන්නක් කියනු අසන්නට නො ලැබෙයි.

බටහිරයන් එසේ කියන්නේ හා ඒ මතවාදය තහවුරුකිරීමට උත්සාහ කරන්නේ ඇයි? ඔවුන්ට අවශ්‍යවන්නේ අපටත් වෙනත් අයටත් ඔවුන් විශාල සේවයක් කර ඇති බව පෙන්වීමට ය. ඔවුන් අප මුස්ලිම් ආක්‍රමණයකින් ගලවාගත් බව පෙන්වීමට ය. මෙරට ඉස්ලාම් ආගම තහවුරුවීම නැවැත්වූයේ පෘතුගීසීන් ඇතුළු බටහිරයන් බව එත්තු ගැන්වීමට ය. එහෙත් ඒ මුළුමහත් කතාව ම අසංගත ප්‍රවාදයක් පමණක් නොව පෘතුගීසීන්ගේ කාර්යභාරය වෙනතකට යොමුකිරීමේ අවශ්‍යතාවෙන් ද යුක්ත වෙයි.

පළමුවෙන් පෘතුගීසීන් හා ස්පාඤ්ඤයන් ද පසුව වෙනත් බටහිරයන් ද අප රටට පැමිණියේ අපට ආදරයෙන් නොව ඔවුන්ගේ ආගම හා අවසාන වශයෙන් ගත්කල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝ පුරා ප්‍රචාරය කිරීමේ අවශ්‍යතාව වෙනුවෙනි. පළමු ලෝක ආධිපත්‍යය සඳහාවූ ගමනට පෙර පාප්වහන්සේ මුළු ලෝකය ම පෘතුගාලය හා ස්පාඤ්ඤය අතර බෙදා දුන්නේ ය. පෘතුගීසීන් හා ස්පාඤ්ඤයන් රටවල් භෞතික ව අල්ලා ගැනීමටත් පෙර පාප්වගන්සේ ඔවුන් අතර රටවල් බෙදා දුන්නේ ය.

පෘතුගීසීන් ලංකාවට පැමිණියේ මුස්ලිම්වරුන්ගෙන් අප රට මුදා ගෙන බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂා කර පෝෂණය කිරීමට නො වෙයි. ඔවුන් පැමිණියේ ආසියාව අල්ලා ගැනීමටත් ආසියාව කතෝලික කිරීමටත් ය. රහි දී ඔවුන්ගේ සංස්කෘතික, ආර්ථික හා දේශපාලන ආධිපත්‍යය පැතිරවීමත් ඒ ඒ රටවල එතෙක් තිබූ සියළු සංස්කෘතීන් නැතිකිරීමත් ඔවුන්ගේ අභිප්‍රාය විය. ඒ දෙවියන් වහන්සේගේ “අණක්” ක්‍රියාත්මක කිරීමක් විය. අදත් ඒ ව්‍යාපෘතිය එලෙස ම එහෙත් සූක්ෂම ව පවත්වාගෙන යනු දක්නට හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva